## වාර්ෂික සැලැස්ම

# තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

## 06 වන ශ්‍රේණිය

පාසල

ගුරුභවතා

කාලච්ඡේද ගණන : 30

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද ගණන Periods | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1. පරිගණකවල වැදගත්කම අගයයි | 1.1 පරිගණකවල කාර්යයන් සහ ලාක්ෂණික ගුණ පැහැදිලි කරයි | • පරිගණකයෙහි නිර්වචනය , ආදාන, සැකසුම, ප්‍රතිදාන, ආචයනය<br>• මිනිසාට එරෙහි ව පරිගණකය<br>○ වේගය සහ කාර්යක්ෂ තාව<br>○ නිරවද්‍යතාව<br>○ විශ්වසනීයතාව<br>○ නියත බව<br>○ ආචයන ධාරිතාව<br>○ පිරිවැය<br>○ බුද්ධිමය බව<br>• නිහිත පරිගණක සහිත උපාංග<br>○ ජංගම දුරකථන<br>○ නූතන රූපවාහිනී යන්ත්‍ර<br>○ රෙදි සෝදන යන්ත්‍ර<br>○ මෝටර් රථ | i. පරිගණකයෙහි සංරචක (components) හඳුනා ගනියි<br>ii. පරිගණකයෙහි භූමිකාව විවිධ පැතිකඩවලින් විස්තර කරයි<br>iii. පරිගණකයෙහි ක්‍රියාව සහ ලාක්ෂණික ගුණ ලැයිස්තු ගත කරයි<br>iv. උපාංග (උපක්‍රම) ආශ්‍රිත නිහි පරිගණක හඳුනා ගනියි | 1 | | | |
| | 1.2 පරිගණක සංරචක හඳුනා ගනියි | • මධ්‍ය සැකසුම් ඒකකය<br>• ආදාන/ප්‍රතිදාන උපක්‍රම<br>• ආචයන උපක්‍රම<br>• සන්නිවේදන උපක්‍රම | i. පරිගණකයෙහි මධ්‍ය සැකසුම් ඒකකය හඳුනා ගනියි<br>ii. විවිධ ආදාන උපාංග (උපක්‍රම) ලැයිස්තු ගත කරයි<br>iii. විවිධ ප්‍රතිදාන උපාංග(උපක්‍රම) ලැයිස්තු ගත කරයි<br>iv. විවිධ ආචයන උපාංග (උපක්‍රම) ලැයිස්තු ගත කරයි<br>v. විවිධ සන්නිවේදන උපාංග (උපක්‍රම) ලැයිස්තු ගත කරයි | 2 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද ගණන Periods | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 1.3 මෘදුකාංගවල අවශ්‍යතාව විස්තර කරයි | • මෘදුකාංග අවශ්‍යතා<br>• මෘදුකාංග - සඳහා උදාහරණ<br>○ පරිගණක ක්‍රීඩා<br>○ මාධ්‍ය ධාවකය<br>○ චිත්‍රක මෘදුකාංග | i. මෘදුකාංගවල අවශ්‍යතාව පැහැදිලි කරයි<br>ii. විවිධ මෘදුකාංග ලැයිස්තු ගත කරයි | 1 | | | |
| | 1.4 දෛනික ක්‍රියාවන් විසඳීම සඳහා පරිගණකයේ භාවිතය අගය කරයි | • පාසලෙහි සහ වෙනත් ප්‍රදේශයන්ගේ ඇති යෙදවුම් භාවිත වන ප්‍රදේශ හඳුනා ගැනීම (අධ්‍යාපන මෘදුකාංග, පුස්තකාල කළමනාකරණ පද්ධති, ... ආදිය)<br>• පරිගණකයෙහි භූමිකාව<br>○ පාසල තුළ<br>○ බැංකු තුළ<br>○ රෝහල් තුළ<br>○ කර්මාන්ත ශාලා තුළ<br>○ ගොවිපොළවල් තුළ | i. අධ්‍යාපන සහ වෙනත් ප්‍රදේශයන්ගේ යෙදවුම් විභවය විස්තර කරයි. | 1 | | | |
| 2. පරිගණක ආරක්ෂිත ව භාවිත කිරීමේ අවශ්‍යතාව අගය කරයි | 2.1 පරිගණක විද්‍යාගාර නිවැරදි ව පරිහරණය කරයි | • අනුගමනය කළ යුතු යහපත් පුරුදු<br>○ විද්‍යාගාරය දූහුවිල්ලෙන් තොර ව තබා ගැනීම<br>○ විද්‍යාගාරය තුළ ආහාර පානාදිය ගැනීමෙන් වැළකීම<br>○ විද්‍යාගාරයේ දී පරිහරණය කරනු ලබන දෑ නියමාකාරයෙන් තැබීම | i. පරිගණක විද්‍යාගාරයේ දී අනුගමනය කළ යුතු යහපත් පුරුදු තේරුම් ගනී<br>ii. පරිගණක විද්‍යාගාරයේ දී හොඳ පුරුදු අනුගමනය කරයි | 1 | | | |
| | 2.2 පරිගණක සහ පර්යන්ත සුපරීක්ෂාකාරී ව භාවිත කරයි | • පරිගණකයේ ආරම්භයට /නිමාවට අදාළ නිවැරදි පියවර<br>• පරිගණකය භාවිතයේ ආචාර ධර්ම<br>• නිවැරදි ඉරියවු<br>• පරිගණක දෘඪාංග ආරක්ෂාකාරී ව බැහැර කිරීම සහ විනාශ කිරීම<br>• මුරපද භාවිත කිරීම | i. පරිගණකයේ ඇරඹුම /නිමාව සඳහා නිවැරදි පියවර අනුගමනය කරයි<br>ii. ආචාර ධර්මවලට අනුකූල ව පරිගණක භාවිත කරයි<br>iii. කල් ඉකුත් ව ඇති පරිගණක/පර්යන්ත උපාංග ආරක්ෂිත ව ඉවත් කරයි<br>iv. 'ආරක්ෂිත පරිගණක පරිහරණය' අවබෝධ කරගෙන භාවිත කරයි | 1 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද ගණන Periods | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 3. මෙහෙයුම් පද්ධති භාවිත කරයි | 3.1 ගොනු හසුරුවයි | • සරල චිත්‍රක මෘදුකාංග උපයෝගී කර ගනිමින් ගොනු හැසිරවීම් කරයි. ඒ මඟින්<br>○ නිර්මාණය<br>○ සුරැකීම<br>○ විවෘත කිරීම<br>○ සංස්කරණය<br>○ වසා දැමීම<br>• කවුළුවක් උපරිම කිරීම / අවම කිරීම / ප්‍රතිප්‍රමාණ කිරීම | i. ගොනුවක් නිමවා සුරකියි<br>ii. ගොනුවක් විවෘත කර සංස්කරණය කරයි<br>iii. කවුළුවක් උපරිම කිරීම / අවම කිරීම / ප්‍රතිප්‍රමාණ කිරීම සඳහා පුරුදු වේ | 2 | | | |
| 4. යෙදුම් මෘදුකාංග උචිත ලෙස භාවිත කරයි | 4.1 පාඨ සංස්කරණයන් සහ චිත්‍රණ මෘදුකාංග ඵලදායී ව භාවිත කරයි | • මූසිකය නිසිලෙස හැසිරවීම සඳහා චිත්‍රණ මෘදුකාංග උපයෝගී කර ගැනීම<br>• යතුරු පුවරු හැසිරවීමේ කුසලතාව ප්‍රවර්ධනය කිරීම සඳහා යතුරු ලියන මෘදුකාංග උපයෝගී කර ගැනීම | i. මූසිකය සහ යතුරුපුවරුව ඵලදායී ව භාවිත කරයි<br>ii. නිවැරදි ඇඟිලි චලන භාවිත කරමින් යතුරු ලියනය කරයි<br>iii. මූසිකය උපයෝගී කරගෙන චිත්‍ර අඳියි | 5 | | | |
| | 4.2 ශ්‍රව්‍ය සහ දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග ඵලදායී ව භාවිත කරයි | • ශ්‍රව්‍ය පසුරක්(Audio clip) නිර්මාණය කිරීමට ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංග භාවිත කිරීම<br>• දෘශ්‍ය පසුරක් නිර්මාණය කිරීමට දෘශ්‍ය සංස්කරණ මෘදුකාංග භාවිත කිරීම | i. ශ්‍රව්‍ය ගොනුවක් නිර්මාණය කරයි<br>ii. දෘශ්‍ය ගොනුවක් නිර්මාණය කරයි | 2 | | | |
| 5. ඇල්ගොරිතම සංකල්පය අගය කර සරල ක්‍රමලේඛ සංවර්ධනය කරයි | 5.1 ඇල්ගොරිතමයකට අදාළ ව වන ප්‍රායෝගික ගැටලු විසඳීමේ ක්‍රියාවලිය විස්තර කරයි | • වට්ටෝරුවකට අනුව අන්තර්ගතයන් සැකසීම<br>(උදා- කේක් එකක් සෑදීම) | i. පියවර අනුක්‍රමයක් ලෙස ගැටලු විසඳීමේ ක්‍රමවේදය හඳුනා ගනියි | 2 | | | |
| | 5.2 ක්‍රියාවලියක් පැහැදිලි කිරීම සඳහා ගැලීම් සටහන් අඳියි | • ගැලීම් සටහන් සංකේත හැඳින්වීම<br>○ ආරම්භය/නිමාව<br>○ ආදාන/ප්‍රතිදාන<br>○ ක්‍රියාවලිය<br>• ගැලීම් සටහන් යොදා ගනිමින් එදිනෙදා කාර්යයන්ගේ ක්‍රියාවලීන් නිරූපණය කිරීම | i. ගැලීම් සටහන් සංකේත හඳුනා ගනියි<br>ii. ගැලීම් සටහනකින් ක්‍රියාවලිය ඉදිරිපත් කරයි | 3 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද ගණන Periods | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 6. තොරතුරු රැස් කිරීම හා සන්නිවේදනය සඳහා අන්තර්ජාලය භාවිත කරයි | 6.1 තොරතුරු මූලාශ්‍රය බෙදාගත හැකි සංචිතයක් ලෙස අන්තර්ජාලය හඳුනා ගනී | • අන්තර්ජාලය හැඳින්වීම<br>• අතරික්සු කිරීම් පුහුණුව සඳහා අධ්‍යාපන වෙබ් අඩවි කරා ප්‍රවේශ වීම | i. අන්තර්ජාලය අර්ථ දක්වයි<br>ii. අන්තර්ජාලයට ප්‍රවේශ වෙයි<br>iii. අධ්‍යාපන වෙබ් අඩවි හරහා තොරතුරු ලබා ගනියි | 3 | | | |
| | 6.2 තොරතුරු ලබා ගැන්ම සඳහා සෙවුම් යන්ත්‍ර භාවිත කරයි | • සෙවුම් යන්ත්‍ර හැඳින්වීම<br>• විශේෂ මාතෘකා ඔස්සේ තොරතුරු සෙවීම සඳහා සෙවුම් යන්ත්‍ර උපයෝගී කරගැනීම | i. සෙවුම් යන්ත්‍ර පරිශීලනය කර තොරතුරු ලබා ගනියි | 5 | | | |
| | 6.3 පරිගණක සහ දත්ත ආරක්ෂිත ව සහ සුරක්ෂිත ව භාවිත කරයි | • ප්‍රවේශයන් පාලනය කිරීමේ යාන්ත්‍රණික යෙදවුම්<br>(පරිශීලක නාමය, මුරපද... ආදිය) | i. සුරක්ෂිත සහ ආරක්ෂිත ක්‍රියාපරිපාටි අනුගමනය කරයි<br>ii. විශ්වාසවන්ත උපදේශකත්ව හපෙන්වීමේ ඇති වැදගත්කම අවබෝධ කර ගනියි | 1 | | | |
| එකතුව | | | | 30 | | | |

ගුරුභවතාගේ අත්සන

...................

විදුහල්පතිතුමාගේ අත්සන

......................

# වාර්ෂික සැලැස්ම

# තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

## 07 වන ශ්‍රේණිය

පාසල

ගුරුභවතා

කාලච්ඡේද ගණන : 30

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1.පරිගණකයේ සංවිධානය හඳුනා ගනී | 1.1 මධ්‍ය සැකසුම් ඒකකයේ (CPU සංරචක හඳුනා ගනියි | • ධ්‍ය සැකසුම් ඒ කයේ(CPU) විවිධ ප්‍රරූප | i. අංක ගණිත හා තාර්කි ඒකකයේ(ALU) සහ පාලන ඒකකයේ (CU) කාර්යයන් විස්තර කරයි | 01 | | | |
| | 1.2 පරිගණකයේ පරිණාමය විස්තර කරයි | • ධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) සංවර්ධනය පිළිබඳ කෙටි ඉතිහාසය : ස්පන්දක වේගය | i. ධ්‍ය සැකසුම් ඒකකයේ (CPU) සංවර්ධන මං සලකුණු ලැයිස්තු ගත කරයි<br>ii. සකසනයේ වේග වෙනස්කම් හඳුනා ගනීයි | 01 | | | |
| 2.මෙහෙයුම් පද්ධතියේ ාර්යයන් ගවේෂණය කරයි | 2.1 මෙහෙයුම් පද්ධති ප්‍රරූප අවබෝධ කර ගනියි | • වින්ඩෝස්, මැක් OS, ලිනක්ස්, ජංගම, ඇන්රොයිඩ් මෙහෙයුම් පද්ධති | i. විවිධ මෙහෙයුම් පද්ධති ලැයිස්තු ගත කරයි<br>ii. විවිධ උපාංගවල මෙහෙයුම් පද්ධති හඳුනා ගනියි | 01 | | | |
| | 2.2 විවිධ මාධ්‍යවල ඩිජිටල් දත්ත එකතුවක් ලෙස පරිගණක ආවයනය හඳුනා ගනියි | • දෘඪ තැටිය, සැණ ධාවකය (Flash Drive), සංගත තැටි (CD), DVD | i. සැණ ධාවක(flash Drive) , දෘඪ ධාවක(Hard Drive), සංගත තැටි (CD), DVD ආදියෙහි භාවිතය විස්තර කරයි | 01 | | | |
| | 2 .3 ෆෝල්ඩර නිර්මාණය කරයි/ ගොනු සුරකියි / විවෘත කරයි / සංස්කරණය කරයි / ඉවත් කරයි / නැවත නම් කරයි / පිටපත් කරයි / විතැන් කරයි. | • ෆෝල්ඩර හා ගොනු මෙහෙයවීම.<br>• ආවයනයක සිට ආවයනයකට ගොනු විතැන් කිරීම හා පිටපත් කිරීම. | i. ෆෝල්ඩරවල ඇති ගොනු විවෘත කර සුරක්ෂිත කරයි<br>ii. කාර්යයන් අනුව ගොනු සංවිධානය කරයි | 02 | | | |
| | 2.4 ගොනු ගුණාංග ගවේෂණය කරයි. | • ප්‍රමාණය, වර්ගය, වෙනස් කළ දිනය හඳුනා ගැනී | i. ගොනුවල ගුණාංග ලැයිස්තු ගත කරයි<br>ii. ගොනුවල ගුණාංග පැහැදිලි කරයි | 01 | | | |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 3.පරිගණක විද්‍යාගාරයක් තුළ විවිධ පූර්වාරක්ෂණ ක්‍රම භාවිත කරයි. | 3.1 පරිගණකයක භෞතික සංරචක ආරක්ෂා කර ගැනීමට විවිධ පූර්වාරක්ෂණ විධි ක්‍රම භාවිත කරයි. | • සර්ජන ආරක්ෂණය සහ වෝල්ටීයතා බිඳ වැටීම්වලට එරෙහි ව ආරක්ෂාව සැපයීම (Fuses හා UPS)<br>• භෞතික හානිවලට එරෙහි ව ආරක්ෂාව (දූවිලි, ආර්ද්‍රතාව, කෘමීන් ආදිය)<br>• පරිගණකය ඇතුළත අධික ලෙස රත් වීමට එරෙහි ව ආරක්ෂාව. | i. දෘඪාංග ආරක්ෂක ගැටලු හඳුනා ගනියි<br>ii. දෘඪාංග සංරචකවලට සිදු වන අවදානම අවම කර ගැනීමට පූර්වාරක්ෂා පියවර ගනියි | 01 | | | |
| | 3.2 පරිගණක මෘදුකාංග සංරචක ආරක්ෂා කිරීමට විවිධ පූර්වාරක්ෂණ විධි ක්‍රම භාවිත කරයි. | • අනිෂ්ට මෘදුකාංගවලට (malware) විරුද්ධ ව ප්‍රතිවෛරස මෘදුකාංග භාවිතය හා වෙනත් පියවර<br>• ප්‍රවේශ පාලන (භෞතික අගුළු සහ මුරපද) | i. මෘදුකාංග ආරක්ෂක ගැටලු හඳුනා ගනී<br>ii. මෘදුකාංග හානි අවම කිරීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂා පියවර ගනියි | 01 | | | |
| 4. එදිනෙදා කටයුතු සඳහා වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි. | 4.1 යතුරු ලියනය කිරීමේ කුසලතාව වර්ධනය කරයි. | • යතුරුලියනය කිරීමේ (ස්පර්ශ යතුරුකරණය) නිසි තාක්ෂණික ක්‍රම භාවිත කිරීම.<br>• යතුරුලියනය කිරීමේ කුසලතාව වර්ධනය කිරීම සඳහා යතුරුලියනය කිරීමේ පුහුණු මෘදුකාංග භාවිත කිරීම. | i. ඉංග්‍රීසි යතුරු පුවරු කුසලතා වර්ධනය කර ගනියි<br>ii. සිංහල / දෙමළ යතුරු පුවරු කුසලතා වර්ධනය කර ගනියි | 01 | | | |
| 5 සරල ක්‍රමලේඛ සංවර්ධනය කරයි.(scratch භාවිතය) | 5.1.තර්කානුකුල ව සම්බන්ධ කිරීම් සහ වියෝජනයෙන්(Decomposing) සරල ගැටලු විශ්ලේෂණ කරයි. | • ගැලීම් සටහන් භාවිතය<br>○ අනුක්‍රමය<br>○ තෝරා ගැනීම (තෝරා ගැනීමේ සංකල්පය)<br>○ පුනර්කරණය( පුනර්කරණයේ සංකල්පය) | i. විවේචනාත්මක සහ විශ්ලේෂණාත්මක චින්තන ක්‍රම ආදර්ශනය කරයි<br>ii. ගැලීම් සටහන්වල අනුක්‍රමය විස්තර කරයි<br>iii. ඒවායේ යෝග්‍ය භාවිතයන් ආදර්ශනය කරයි | 02 | | | |
| | 5.2 දෘශ්‍ය සංවර්ධන පරිසරය භාවිත කරමින් සරල වැඩසටහන් සංවර්ධනය කරයි ( Scratch භාවිතය) | • පරිගණක වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා අන්තර් ක්‍රියාකාරී සංවර්ධන පරිසරය(IDE) හැඳින්වීම<br>• ක්‍රමලේඛන භාෂාවක් ආධාරයෙන් (අතුරුමුහුණත් භාවිතයෙන්) විශේෂ සරල වැඩසටහන් (අනුක්‍රමය අඩංගු) සිසුන්ට ඉගැන්වීම නිර්මාණය | i. Scratch ක්‍රමලේඛන/වැඩසටහන් අන්තර් ක්‍රියාකාරී සංවර්ධන පරිසරය(IDE) යොදා ගනියි<br>ii. සරල වැඩසටහන් සංවර්ධනය කිරීමට මූලික අනුක්‍රමික පාලනයන් භාවිත කරයි | 03 | | | |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 5.3 සරල වැඩසටහන්වල ඇති විචල්‍යය සංකල්පය පැහැදිලි කරයි | • විචල්‍ය අර්ථ දැක්වීම<br>• වැඩසටහන්වල විචල්‍යයන් භාවිත කිරීම | i. වැඩසටහන්වල විචල්‍යයන් භාවිත කිරීම විස්තර කරයි<br>ii. සුදුසු පරිදි විචල්‍යයන් සමඟ වැඩසටහන් ලියයි | 02 | | | |
| | 5.4 වැඩසටහනක දෝෂ සංකල්පය Bugs ලෙස හඳුනා ගනියි | • දෝෂ සහිත වැඩසටහන් දෝෂ රහිත කිරීම හඳුන්වාදීම සහ ප්‍රතිදානය නිරීක්ෂණය | i. ක්‍රමලේඛයන්ගේ දෝෂවල බලපෑම සහ දෝෂ වැළැක්වීමට ගත හැකි පූර්වාරක්ෂාවන් විස්තර කරයි | 01 | | | |
| 6 සමර්පණ නිර්මාණය සඳහා සමර්පණ මෘදුකාංග භාවිත කරයි. | 6.1 සමර්පණයක් නිර්මාණය කිරීම සඳහා සමර්පණ මෘදුකාංගයේ මූලික ක්‍රියාවන් භාවිත කරයි. | • සමර්පණයක් නිර්මාණය, විවෘත කිරීම, ගබඩා කිරීම සහ වැසීම<br>• කදා එක් කිරීම<br>• පාඨ, පින්තූර, හැඩ, clip art, word art, … ආදි ගොනුවක්/වස්තුවක් ඇතුළත් කිරීම<br>• පාඨ හැඩසව් කිරීම<br>• කදාවකට බහුමාධ්‍ය සහ වගු ඇතුළත් කිරීම<br>• කදා පිරිසැලසුම<br>• කදා විතැන් කිරීම(move), පිටපත් කිරීම(Duplicate), සැඟවීම, මැකීම<br>• කදා සංක්‍රාමණය(Slide transition) | i. සමර්පණ මෘදුකාංග භාවිතයෙන් සමර්පණයක් නිර්මාණය කරයි | 05 | | | |
| 7.තොරතුරු සහ සන්නිවේදන අරමුණු සඳහා අන්තර්ජාලය භාවිත කරයි | 7.1 අන්තර්ජාලයේ තිබිය හැකි (පාඨ, චිත්‍රක, දෘශ්‍යක ආදී) සම්පත් භාවිත කරයි. | • විශ්ව විසිරි වියමන(WWW), ඒකාකාරී සම්පත් නිශ්චායකය (URL)<br>පාඨ, චිත්‍රක, දෘශ්‍යක ආදිය බාගත කිරීම(download)<br>• පෘථිවි සිතියම් ප්‍රවේශය<br>• විශ්වසනීය සහ විශ්වසනීය නොවන වෙබ් අඩවි<br>• සත්‍ය හා විශ්වසනීය තොරතුරු | i. තොරතුරු රැස් කිරීම සඳහා අන්තර්ජාලය භාවිත කරයි<br>ii. විශ්වසනීය සහ විශ්වසනීය නොවන වෙබ් අඩවි හඳුනා ගනියි<br>iii. සත්‍ය හා විශ්වසනීය තොරතුරු හඳුනා ගනියි | 01 | | | |

| නිපුණතා | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 7.2 මාර්ගඅපගත(E-mail) සහ මාර්ගගත(Chat) සන්නිවේදනයන් භාවිත කරයි | • වෙබ් අඩවි පදනම් කරගත් නිදහස් ඊ -තැපැල<br>• ගිණුම් නිර්මාණය කිරීම. ඊ-තැපැල භාවිතය: විෂය, ලබන්නා, පිටපත , රහස් පිටපත, ඇමුණුම්, ඉදිරියට යන්න, එන ලිපි, යන ලිපි, යැවීම සඳහා සකස් කරන ලද එහෙත් නොයැවූ ලිපි, මකාදැමන ලද ලිපි, ස්පෑම්, පිළිතුරු යැවීම<br>• මාර්ගගත සම්මන්ත්‍රණ | i. ඊ-තැපැල හරහා සන්නිවේදනය | 02 | | | |
| | 7.3 HTML භාවිතයෙන් වෙබ් පිටු සංවර්ධනය කරයි | • පාඨ, රූප භාවිත කරමින් වෙබ් පිටුවක් නිර්මාණය කිරීම<br>○ පාඨ හැඩසවි කිරීම<br>○ වර්ණ<br>○ ලැයිස්තු<br>• වෙබ් පිටු (බාහිර අඩවි / ගොනු) සම්බන්ධ කිරීම | i. සරල වෙබ් අඩවියක් සැලසුම් කරයි<br>ii. සරල වෙබ් අඩවියක් නිර්මාණය කරයි | 02 | | | |
| | 7.4 සුරක්ෂිත ව, පරිස්සම් සහිත ව හා සදාචාරාත්මක ව අන්තර්ජාලය භාවිත කරයි | • අනවසර පිවිසුම්වලට හා අනිෂ්ට මෘදුකාංගවලට(malware) එරෙහි ව ආරක්ෂාව<br>○ අනවසරයෙන් ඇතුළු වීම (Hacking)<br>○ වෛරස් ප්‍රහාර<br>○ මෘදුකාංග කොල්ල කෑම් (software piracy)<br>• සදාචාරාත්මක ව අන්තර්ජාලය භාවිතය<br>○ සයිබර් හිරිහැර කිරීම(cyber bullying)<br>○ අන් අයගේ දත්ත සොරකම් කිරීම(stealing others data )<br>• නාඳුනන පාර්ශ්වයන්ට එරෙහි ව මාර්ගගත ආරක්ෂාව පිළිබඳ පෙර පරිස්සම | i. සුපරික්ෂාකාරී ව අන්තර්ජාලය භාවිත කරයි<br>ii. ආරක්ෂිත ව අන්තර්ජාලය භාවිත කරයි<br>iii. ආචාරශීලී ව අන්තර්ජාලය භාවිත කරයි | 02 | | | |
| එකතුව | | | | 30 | | | |

**ගුරුභවතාගේ අත්සන** **විදුහල්පතිතුමාගේ අත්සන**

................... ......................

# වාර්ෂික සැලැස්ම

# තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

## 08 වන ශ්‍රේණිය

පාසල

ගුරුභවතා

කාලච්ඡේද ගණන : 30

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල සීමාව /කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1. උපදෙස් හා දත් පරිගණකයේ නිරූපණය කරන්නේ කෙසේ දැයි විමර්ශනය කරයි | 1.1 දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවටත් ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවටත් පරිවර්තනය කරයි. | ○ සංඛ්‍යා පද්ධති හැඳින්වීම<br>• දශමය සංඛ්‍යා හා ද්විමය සංඛ්‍යා පද්ධති<br>• දශමය සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවට පරිවර්තනය<br>• ද්විමය සංඛ්‍යා දශමය සංඛ්‍යා බවට පරිවර්තනය | I. 10 සහ 2 පාද පදනම් කරගෙන සංඛ්‍යා පද්ධති විස්තර කරයි<br>II. දශමය පූර්ණ සංඛ්‍යා ද්විමය සංඛ්‍යා බවටත් ද්විමය සංඛ්‍යා දශමය පූර්ණ සංඛ්‍යා බවටත් පරිවර්තනය කරයි | 03 | | | |
| | 1.2. පරිගණකයේ ක්‍රියාකාරී තර්කණය ( ද්විමය සංකල්ප ) අගය කරයි. | • 0 සහ 1 භාවිතයෙන් දත්ත නිරූපණය කිරීමේ ක්‍රමය<br>• පරිගණක සංරචක අතර දත්ත ද්විමය ආකාරයෙන් ගලා යා | I. ධන දශමය පූර්ණ සංඛ්‍යා ද්විමය සංඛ්‍යා මඟින් නිරූපණය කරයි.<br>II. දෘශ්‍ය ඒකකය මත "A" අක්ෂරය (අක්ෂර සංඛ්‍යා, සංකේතාත්මක) හෝ ප්‍රතිබිම්බ (bitmap) භාවිතයෙන් ප්‍රදර්ශනය කිරීමේ ක්‍රමය විස්තර කරයි | 02 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල සීමාව /කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 2. මෙහෙයුම් පද්ධතිය සමඟ කාර්යක්ෂම ව හා ඵලදායී ව පරිගණක භාවිත කරයි. | 2.1. සැකසුම් කිරීම සහ වින්‍යාසකරණය සඳහා මෙහෙයුම් පද්ධති භාවිත කරයි. | • ප්‍රදේශීය සැකසීම; දිනය, වේලාව, මුදල් ඒකක, සංඛ්‍යා ආකෘති<br>• ගොනු ගුණාංග<br>• ගොනු සෙවීම | i. සැකසුම් කිරීම: දිනය, වේලාව, මුදල් ඒකක, සංඛ්‍යා ආකෘති සැකසුම් කරයි<br>ii. ගොනු ගුණාංග සැකසීම: පඨනමාත්‍ර, සැඟවුණු, පිහිටීම, ප්‍රමාණය සැකසුම් කරයි<br>iii. දිගුව සමඟ ගොනු සොයයි | 02 | | | |
| | 2.2 පරිගණකවල මූලික දෝෂාවේක්ෂණය සහ නඩත්තුව (දෘඪාංග සහ මෘදුකාංග) ගවේෂණය කරයි. | • සරල පරිගණක දෝෂ ගවේෂණය.<br>• දෘඪාංග දෝෂ (යතුරු පුවරු, මූසික, විදුලිබල රැහැන්, ජාලකරණ රැහැන්, VGA රැහැන්)<br>• ශබ්ද ප්‍රතිදාන දෝෂ ( ස්පීකර් සම්බන්ධතාවවේ, ශබ්ද ප්‍රමාණය පිරික්සීම)<br>• කෙවෙනි සම්බන්ධ කිරීම (PS/2, USB, Micro USB VGA, HDMI, Parallel, RJ45, Memory Card Reader)<br>• සමහර පරිගණක මෘදුකාංග දෝෂ ගවේෂණය සහ විසඳීම<br>• විකෘත මෘදුකාංග<br>• හිස් ඩෙස්ක්ටොප් | i. සමහර දෘඪාංග දෝෂ ගවේෂණය කර විසඳයි<br>ii. මෘදුකාංග දෝෂ ගවේෂණය කර විසඳයි | 02 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල සීමාව /කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| 3.එදිනෙදා ක්‍රියාකාරකම් සඳහා<br>වදන් සැකසුම් මෘදුකාංග භාවිත කරයි. | 3.1 ලේඛනයක් සකස් කිරීමේ දී වදන් සැකසුම් මෘදුකාංගයන්ගේ මූලික ක්‍රියාකාරකම් භාවිත කරයි | • ලේඛනයක් පිළියෙළ කිරීම, විවෘත කිරීම, ගබඩා කිරීම සහ වැසීම<br>• පාඨ හැඩසව් කිරීම<br>• පාඨ, චිත්‍රක, හැඩ, clip art, word art, ... ආදි ගොනු/වස්තු ඇතුළත් කිරීම<br>• වගුවක් ඇතුළත් කිරීම<br>• අක්ෂර වින්‍යාසය ඇතුළු භාෂාත්මක දෝෂ පරික්ෂා කිරීම<br>• ලැයිස්තු | i වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන් ලේඛනයක් පිළියෙළ කරයි | 06 | | | |
| 4. අනුක්‍රමය, තේරීම,<br>පුනර්කරණය සහිත සරල ගැටලු විසඳීමට ගැලීම් සටහන් භාවිත කරයි. (Scratch භාවිතය) | 4.1. ගැටලුව විශ්ලේෂණය කරයි. | • ආදාන, සැකසීම සහ ප්‍රතිදාන පියවර හඳුනා ගැනීම<br>• ජංගම සහ සුහුරු උපාංග සඳහා සැකසූ යෙදවුම් හඳුනා ගැනීම<br>• ගැලීම් සටහන් භාවිතයෙන් විසඳුම් ප්‍රලේඛනය | i. එදිනෙදා ජීවිතයේ සරල ගැටලු විශ්ලේෂණය කරයි<br>ii. කැටි සටහන් මඟින් ගැටලු විස්තර කරයි.<br>iii. ඇප්ලිකේෂන්(Application) ලෙස ජංගම සහ සුහුරු උපාංගවල යෙදවුම් විස්තර කරයි | 02 | | | |
| | 4.2 ඇල්ගොරිතම සංවර්ධනය සඳහා පාලන ව්‍යූහයන් භාවිත කරයි. | ○ සරල ඇල්ගොරිතම සහ තේරීම් පාලන ව්‍යූහයන් හැඳින්වීම<br>○ පරිගණක භාෂාවන්ගේ(අතුරු මුහුණත් භාවිතය) දෘශ්‍ය ආධාරක භාවිතයෙන් සරල වැඩසටහනක්(අනුක්‍රමය සහ තේරීම) පිළියෙළ කිරීම | i. පාලන ව්‍යූහයන් විස්තර කරයි.(තේරීම පමණි)<br>ii. එදිනෙදා ජීවිතයේ සරල ගැටලු විසඳීමට පාලන ව්‍යූහයන් යොදා ගනියි. | 05 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාල සීමාව /කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 5. ක්‍රමලේඛන තර්ක ක්‍රියාත්මක කිරීමට, භෞතික ආගණනය සඳහා මෘදුකාංග පැකේජ භාවිත කරයි. | 5.1. පුනර්කරණ ක්‍රමලේඛන සංවර්ධනය සඳහා ක්‍රමලේඛන භාෂා භාවිත කරයි. | ○ භෞතික ආගණන උපාංග<br>○ පාලන ව්‍යූහ භාවිතය : පුනර්කරණය (පුනරුක්තිය)<br>○ LED බල්බ දැල්වීම හා නිවීම<br>○ සරල පරිගණක ක්‍රමලේඛ භාවිතයෙන් LED බල්බ දල්වන රටා සැකසීම | i. භෞතික ආගණනයේ ලක්ෂණ හඳුනා ගනියි.<br>ii. සරල උපාංග පරිහරණය සඳහා ක්‍රමලේඛ සකසා ක්‍රියාත්මක කරයි. උදාහරණ: අගයන් ආදේශ කරමින් LED දැල්වීම හා නිවීම | 05 | | | |
| 6. අන්තර්ජාලය භාවිතයෙන් අධ්‍යාපන තොරතුරු ගවේෂණය කරයි. | 6.1. අන්තර්ජාලයේ තොරතුරු සොයයි. | ○ සෙවුම් යන්ත්‍ර : Google, Yahoo ...... ආදි<br>○ අධ්‍යාපන අතරික්සු | i. සෙවුම් යන්ත්‍ර හඳුනා ගනියි.<br>ii. අන්තර්ජාලය භාවිතයෙන් තොරතුරු ගවේෂණය කරයි. | 01 | | | |
| | 6.2 උසස් ගුණාංග සහිත සරල වෙබ් අඩවි නිර්මාණය කරයි. | ○ උසුලන, මූලිකාංග, ගුණ, පාඨ හැඩසවි ගැන්වීම යනාදිය<br>○ අධිසම්බන්ධකවල උසස් ගුණාංග | i. පිරිවිතර අනුව වෙබ් අඩවි පිරිසැලසුම් කරයි<br>ii. පිරිසැලසුම අනුව වෙබ් අඩවි නිර්මාණය කරයි. | 02 | | | |
| | | | එකතුව | 30 | | | |

**ගුරුභවතාගේ අත්සන** ..................

**විදුහල්පතිතුමාගේ අත්සන** ......................

# වාර්ෂික සැලැස්ම

# තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

## 09 වන ශ්‍රේණිය

පාසල

ගුරුභවතා

කාලච්ඡේද ගණන : 30

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1. පරිගණක සහ පර්යන්ත උපාංග මිල දී ගැනීම සඳහා පිරිවිතර සකස් කරයි | 1.1 පරිශීලක -අවශ්‍යතාව මත පරිගණක සහ ඒවායේ පර්යන්ත උපාංග හඳුනා ගනී | • පරිගණක සංරචකවල පිරිවිතර හා එවා භාවි කරන්නාගේ අවශ්‍යතාව අනුව තේරුම් ගැනීම | i. පරිගණකයක සහ එහි පර්යන්තවල මූලික පිරිවිතර විස්තර කරයි | 1 | | | |
| | 1.2 පරිශීලක අවශ්‍යතාව පරිගණකයකට සහ පර්යන්ත උපාංග බවට පත් කරයි | • පරිගණකයේ සහ එහි පර්යන්ත උපාංගවල මූලික පිරිවිතර<br>○ සකසනයේ වර්ගය සහ වේගය<br>○ දෘඪ තැටි ධාරිතාව<br>○ මොනිටරයේ පිරිවිතර<br>○ සසම්භාවී ප්‍රවේශ මතකයේ (RAM) පිරිවිතර<br>○ දෘශ්‍ය චිත්‍රක අනුහුරුකුරුව (VGA) සහ ශබ්ද<br>• වගකීම<br>• ඇතුළත් මෘදුකාංග<br>• අලෙවියෙන් පසු සේවා | i. ාක්ෂණික පිරිවිතර අනුව පරිශීලක අවශ්‍යතා හඳුනා ගනී<br>ii. අවශ්‍ය තාක්ෂණික පිරිවිතර නිර්ණය කරයි | 1 | | | |
| 2. ගණනය කිරීම් හා සරල දත්ත විශ්ලේෂණ සඳහා පැතුරුම් පත් මෘදුකාංගය භාවිත කරයි | 2.1 පැතුරුම්පත් මෘදුකාංගවල මූලිකාංග විස්තර කරයි | • පැතුරුම් පත් මෘදුකාංග (IDE) හඳුන්වාදීම<br>• වැඩ පොත, වැඩප<br>• වැඩපතක් ඇතුළත් කිරීම, නම වෙනස් කිරීම, මකා දැමීම<br>• කෝෂ ලිපියොමු | i. පැතුරුම් පත් මෘදුකාංග (IDE) භාවිත කරයි<br>ii. කෝෂ ලිපින භාවි කරයි | 1 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 2.2 වැඩපතකට දත්ත ඇතුළත් කරයි | • තීරුවක(column) දිග සහ පේළියක උස වෙනස් කිරීම<br>• කෝෂයක් හැඩසවීම<br>○ පාඨ එක එල්ල කිරීම, අකුරු වර්ගය, බෝඩරය, පිරවුම<br>• දත්ත ප්‍රරූප - අගය, සංඛ්‍යාත්මක, Currency (මුදල්), දිනය සහ වේලාව<br>• වැඩ පොතක් ගබඩා කිරීම | i. අවශ්‍ය තීරු පළල සහ පේළි උස නිර්ණය කරයි<br>ii. කෝෂ හැඩසවි කරයි<br>iii. කෝෂ හැඩසවි කිරීම පැහැදිලි කරයි<br>iv. වැඩ පොතක් පිළියෙළ කර ගබඩා කරයි | 2 | | | |
| | 2.3 සරල ගණිතමය ගණනය කිරීම් ක්‍රියාවේ යොදවයි | • ගණිතමය ගණනය කිරීම් භාවිත කරයි<br>○ එකතු කිරීම්<br>○ අඩු කිරීම්<br>○ ගුණ කිරීම්<br>○ බෙදීම් | i. ගණිත කාරක හඳුනා ගනී<br>ii. ගණිත කාරක නිවැරදි ව භාවිත කරයි | 1 | | | |
| | 2.4 සරල ගණිතමය ගණනය කිරීම් සඳහා ශ්‍රිත භාවිතය සහ දත්ත අනුපිළිවෙලට තේරීම (sorting) | • පැතුරුම් පත්වල භාවිත කරන මූලික ශ්‍රිත SUM, AVERAGE, MAX, MIN, COUNT, COUNTA<br>• දත්ත අනුපිළිවෙලට තේරීම (sorting) | i. අවශ්‍ය කාර්යයන් සඳහා ශ්‍රිත හා එහි පරාමිතීන් හඳුනා ගනී<br>ii. කාර්යය ඉටු කිරීම සඳහා පැතුරුම් පත් මෘදුකාංග මෙවලම් යොදා ගනී<br>iii. දත්ත අනුපිළිවෙලට තේරීම(sorting) සඳහා පැතුරුම් පත් මෘදුකාංග යොදා ගනී | 1 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 2.5 දත්ත ප්‍රදර්ශනයට විවිධ ප්‍රස්තාර භාවිත කරයි | • මූලික ප්‍රස්තාර වර්ග:<br>තීර ප්‍රස්තාර, ස්තම්භ ප්‍රස්තාර, රේඛා ප්‍රස්තාර, වෘත්ත ප්‍රස්තාර<br>• ප්‍රස්තාරවල විකල්ප:<br>ප්‍රස්තාර වර්ගය වෙනස් කිරීම, විස්තර පාඨය හැඩසවි ගැන්වීම, දත්ත ශ්‍රේණි හා අක්ෂ හැඩසවි ගැන්වීම පේළිය සහ තීරුව මාරු කිරීම | i. කාර්යයට අදාළ ප්‍රස්තාර වර්ගය හඳුනා ගනී<br>ii. කාර්යයට අදාළ මෙවලම් භාවිතයෙන් ප්‍රස්තාර නිර්මාණය කරයි<br>iii. කාර්යයට අදාළ දත්තවලට සුදුසු ප්‍රස්තාර නිර්මාණය කර හැඩසවි ගන්වයි | 1 | | | |
| 3. අනුක්‍රමය, තෝරාගැනීම සහ පුනර්කරණය සහිත සරල ක්‍රමලේඛ විසඳීම් සඳහා ගැලීම් සටහන් භාවිත කරයි (Scratch භාවිතය) | 3.1 ගැලීම් සටහන් ඇඳීම සඳහා අනුක්‍රම, තේරීම් හා පුනර්කරණ පාලන ව්‍යූහය භාවිත කරයි | • බහු තේරීම් භාවිතයෙන් ගැටලු විසඳීම<br>• පුනර්කරණයන් භාවිතයෙන් ගැටලු විසඳීම<br>• බහු පුනර්කරණයන් භාවිත කරමින් ගැටලු විසඳීම | i. සරල ගැටලු විසඳීම සඳහා ගැලීම් සටහන් අඳියි<br>ii. ගැටලුව හඳුනාගෙන විසඳුම තීරණය කරයි | 2 | | | |
| | 3.2 දෘශ්‍ය ආධාරක (visual support) සමඟින් සරල ගැටලු විසඳීම සඳහා තේරීම් හා පුනර්කරණ පාලන ව්‍යූහ භාවිත කරයි | • බහු කොන්දේසි සහිත තේරීම් පාලන ව්‍යූහ<br>• සරල පුණර්කරණයන් සහිත පාලන ව්‍යූහ<br>• දෘශ්‍ය ආධාරක සහිත ක්‍රමලේඛ භාෂා(අතුරු මුහුණත් භාවිතය) භාවිතයෙන් සරල ක්‍රමලේඛ (අනුක්‍රම, තෝරාගැනීම හා පුනර්කරණ) සැකසීම | i. බහු කොන්දේසි සහිත තේරීම් පාලන ව්‍යූහයන් යොදා ගනියි<br>ii. තෝරා ගැනීම් හා පුනර්කරණ අතර වෙනස හඳුනා ගනී<br>iii. අදාළ ගැටලු විසඳීම සඳහා පුනර්කරණ පාලන ව්‍යූහය භාවිත කරයි | 5 | | | |
| | 3.3 නීඩිත පුනර්කරණ සහිත වැඩසටහන් සංවර්ධනය කිරීම සඳහා දෘශ්‍ය ආධාරක සහිත ක්‍රමලේඛ මෘදුකාංග භාවිත කරයි | • මූලික පුනර්කරණ පාලන ව්‍යූහ භාවිත කරමින් වැඩසටහන් සංවර්ධනය<br>• තෝරාගැනීම් හා පුනර්කරණ සහ නීඩිත පුනර්කරණ පාලන ව්‍යූහය සමඟ දෘශ්‍ය වැඩසටහන් සංවර්ධනය | i. ක්‍රමලේඛ පුනර්කරණ භාවිත කරමින් සජීවකරණ වැඩ සටහන් නිර්මාණය කරයි<br>ii. පුනර්කරණ ව්‍යූහයේ විවිධ භාවිත විස්තර කරයි | 3 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 3.4 ආරාව(array) විචල්‍ය සමඟ ක්‍රමලේඛ සකස් කරයි | • ආරාව විචල්‍ය අර්ථ දැක්වීම<br>• ගැටලු විසඳීමට ආරාව විචල්‍ය යොදා ගැනීම | i. ආරාව විචල්‍ය භාවිතයන් විස්තර කරයි<br>ii. සරල ගැටලු විසඳීමට ක්‍රමලේඛයක ආරාව විචල්‍ය භාවිත කරයි | 2 | | | |
| | 3.5 ගැටලුවකට නිසි තාක්ෂණිකර විසඳුම් ලැබෙන්නේ දැයි සහතික කිරීම සඳහා ඇගයීම | • ගැටලුවක් උචිත අයුරින් වියෝජනය කිරීම (decomposition)<br>• වියෝජනයේ දී සියලු අංශ ආවරණය වන්නේ දැයි සහතික කිරීම<br>• නිවැරදි වියෝජනය සමඟින් ක්‍රමලේඛයක් සැලසුම් කර ලිවීම | i. නිවැරදි ව හා කාර්යක්ෂම ව ගැටලුවකට විසඳුම් සොයා ගනු ලැබුවේදැයි ඇගයීම සිදු කරයි | 1 | | | |
| 4. භෞතික පරිගණන කුසලතා වර්ධනය කරයි | 4.1 සරල අංකිත පද්ධති ක්‍රමලේඛනය කරයි (ක්ෂුද්‍ර පාලන පාදක කට්ටලය) | • සංවේදක මඟින් ලැබෙන ආදාන හඳුනා ගැනීම සඳහා වැඩසටහන් සකස් කිරීම<br>• යෝජක (actuators) පාලනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම | i. සංවේදක මඟින් ලැබෙන ආදාන හඳුනා ගැනීම සඳහා වැඩසටහන් සකස් කරයි<br>ii. සරල සංවේදක යෝජක (actuators) පාලනය කිරීම සඳහා වැඩසටහන් සකස් කරයි | 5 | | | |
| 5. සන්නිවේදනය සහ සම්පත් පොදුවේ භාවිතය සඳහා පරිගණක ජාල විමර්ශනය කරයි | 5.1 පාසල් පරිගණකාගාරයේ පරිගණක ජාලයේ වන ප්‍රධාන සංරචක ගවේෂණය කරයි | • පාසල් පරිගණක ජාලයේ වන ප්‍රධාන සංරචක (පරිගණක, ජාලකරණ අතුරුමුහුණත් කාඩ්පත, ස්විචය, ... ආදිය) | i. පාසල් පරිගණක ජාලයේ වන ප්‍රධාන සංරචක විස්තර කරයි | 1 | | | |
| | 5.2, සන්නිවේදනය සහ සම්පත් පොදුවේ ප්‍රයෝජනය ගැනීමට පාසල් පරිගණක ජාලය යොදා ගනියි | • පාසල් ජාලය හරහා පණිවිඩයක් යැවීම<br>• සම්පත් පොදුවේ භාවිතය(මෘදුකාංග, ගොනු, ෆෝල්ඩර, සංගත තැටි, මුද්‍රණ යන්ත්‍ර, ... ආදි) | i. පාසල් ජාලය හරහා පණිවිඩයක් යවයි<br>ii. පාසල් ජාලය හරහා සම්පත් පොදුවේ භාවිත කරයි | 1 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලය/ කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය බලපෑම සහ වෘත්තීය අවස්ථා ගවේෂණය කරයි | 6.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය බලපෑම විස්තර කරයි | • කාර්යාලයීය ස්වයංකරණ<br>• ඊ-ඉගෙනුම<br>• ඊ- වාණිජ්‍ය, එම්- වාණිජ්‍ය<br>• ඊ- සෞඛ්‍ය<br>• ඊ-රාජ්‍ය<br>• අංකිත බෙදුම<br>• විද්‍යුත් අපද්‍රව්‍ය ආරක්ෂිත ව බැහැර කිරීම | i. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සමාජීය භාවිතයන්ගේ ප්‍රතිලාභය විස්තර කරයි<br>ii. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ භාවිතයන්ගේ සෘණාත්මක දර්ශනය හටගැනීම විස්තර කරයි | 1 | | | |
| | 6.2 පරිගණක ආශ්‍රිත රැකියා අවස්ථා විස්තර කරයි | • රැකියා අවස්ථා<br>○ මෘදුකාංග තත්ත්ව සහතික ඉංජිනේරු<br>○ මෘදුකාංග ඉංජිනේරු<br>○ තාක්ෂණික මහපෙන්වන්නා<br>○ දත්ත සමුදාය පරිපාලක<br>○ මෘදුකාංග නිර්මාණ ශිල්පියා<br>○ වැඩ සටහන් සම්පාදක<br>○ පද්ධති විශ්ලේෂක<br>○ වෙබ් අඩවි යෙදීම් සංවර්ධනකරු<br>○ චිත්‍රක නිර්මාණකරු<br>○ ජාල පරිපාලක | i. නවීන ලෝකයේ රැකියා අවස්ථා විස්තර කරයි<br>ii. පරිගණක ආශ්‍රිත වෙනස් වෘත්තීන්ගේ කාර්යය, භූමිකාව විස්තර කරයි | 1 | | | |
| | | | එකතුව | 30 | | | |

**ගුරුභවතාගේ අත්සන** ..................

**විදුහල්පතිතුමාගේ අත්සන** .....................

# වාර්ෂික සැලැස්ම

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)

# තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය

## 10 වන ශ්‍රේණිය

පාසල :

ගුරුභවතා :

කාලච්ඡේද ගණන : 90

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1. තොරතුරු ලෝකයෙහි පරිගණකයේ ස්ථානය විමර්ශනය කරයි. | 1.1 ජාතික සංවර්ධනයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දායකත්වය විමර්ශනය කරයි. | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන පදයේ අර්ථ දැක්වීම<br>• සමාජය තුල තො. ස. තා. භාවිතය : e-රාජ්‍ය, කෘෂිකාර්මාන්තය, අධ්‍යාපනය, සෞඛ්‍යය, කර්මාන්ත, විනෝදාස්වාද | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ස්වභාවය පැහැදිලි කරයි.<br>• වැඩ ලෝකයේ විවිධ ක්ෂේත්‍ර තුළ තො. ස. තා. භාවිතය විවරණය කරයි. | 3 | | | |
| | 1.2 දත්ත තොරතුරු බවට පරිවර්තනය කරන පද්ධතියක් ලෙස පරිගණකයේ කාර්යය විමර්ශනය කරයි. | • පද්ධතියක සංඝටක<br>• දත්ත හා තොරතුරු අතර වෙනස<br>• දත්ත ආදාන ලෙස හා තොරතුරු ප්‍රතිදාන ලෙස සැලකීම<br>• දත්ත සැකසීම යනු දත්ත තොරතුරු බවට පත් කරන ක්‍රමය බව | • එදිනෙදා ජීවිතයෙහි දක්නට ලැබෙන පද්ධති විස්තර කරයි.<br>• තොරතුරු පද්ධතියක ප්‍රධාන සංඝටක ආශ්‍රයෙන් එහි ක්‍රියාකාරිත්වය විවරණය කරයි. | 2 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 1.3 පරිගණකයේ ප්‍රධාන සංවර්ධන අවස්ථා හඳුනා ගැනීමට එහි පරිනාමය ගවේෂණය කරයි. | • පරිගණක පරම්පරා<br>• සකසනයේ තාක්ෂණයේ පරිනාමය<br>○ රික්ත නලය<br>○ ට්‍රාන්සිස්ටරය<br>○ සංග්‍රහිතපරිපථ (LSIC, VLSIC)<br>• පද්ධති ලාක්ෂණිකවල සංවර්ධනය<br>○ ප්‍රමාණය<br>○ ධාරිතාව<br>○ වේගය<br>○ නිරවද්‍යතාව<br>○ කාර්යක්ෂමතාව | • පරිගණක පරිනාමයේ මං සලකුණු විස්තර කරයි.<br>• පරිනාමය සමඟ පද්ධති ලාක්ෂණිකවල සංවර්ධනය සාකච්ඡා කරයි. | 2 | | | |
| 2. පරිගණක දෘඩාංග තෝරාගෙන භාවිත කරයි. | 2.1 විවිධ ක්‍රම භාවිතයෙන් පරිගණක වර්ගීකරණ සිදු කරයි. | • පරිගණක වර්ගීකරණය<br>○ ක්‍ෂුද්‍ර<br>○ අංකිත හා දෙමුහුම් | • විවිධ පන්තිවලට අයත් පරිගණක පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරයි. | 2 | | | |
| | 2.2 කාර්යය අනුව පරිගණක පිළිබඳ ගවේෂණයක යෙදෙයි | • පරිගණකයක හා එහි පර්යන්ත උපකරණවල කාර්යයන්<br>○ ආදාන<br>○ ප්‍රතිදාන<br>○ සැකසුම<br>○ සංචායනය<br>○ සන්නිවේදනය | • පරිගණක පද්ධතියක සංඝටක හඳුනා ගනියි.<br>• එක් එක් සංඝටකයේ කාර්යයන් විස්තර කරයි. | 3 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 2.3 පරිගණකයේ මූලික පර්යන්ත උපකරණ හඳුනාගෙන ඒවා පරිගණකයට සම්බන්ධ කරයි. | • මූලික පරිගණක සංඝටක: යතුරු පුවරුව, මූසිකය, පද්ධති ඒකකය මොනිටරය<br>• Ports<br>○ PS/2 port<br>○ ශ්‍රේණිගත, සමාන්තරගත<br>○ USB port<br>○ RJ 45<br>○ Video port | • පරිගණකයක ප්‍රධාන භෞතික සංඝටක විස්තර කරයි.<br>• පරිගණක ports වල කාර්යය විස්තර කරයි. | 2 | | | |
| | 2.4 මූලික කැටි සටහන් භාවිතයෙන් පරිගණක පද්ධතියක් පැහැදිලි කරදෙයි. | • අංක ගණිතමය සහ තාර්කික ඒකකය පාලක ඒකකය<br>• ගැලීම් මාර්ගය<br>○ දත්ත හා උපදෙස් සංඥා<br>○ පාලක සංඥා | • මූලික තැනුම් ඒකකවල කාර්යය පහදයි.<br>• පරිගණකය තුළ සංඥා ගැලීම පහදා දෙයි. | 1 | | | |
| | 2.5 ප්‍රශස්ත සන්නිවේදනය සඳහා පරිගණක ජාලවල වාසි හා අවාසි විමසා බලයි. | • පරිගණක ජාලවල අරමුණ<br>○ දත්ත සන්නිවේදනය<br>○ සම්පත් බෙදා ගැනීම<br>• පරිගණක ජාලයක සංඝටක<br>○ ජාල අතුරු මුහුණත<br>○ අභ්‍යන්තර හා බාහිර උපක්‍රම | • ජාලකරණයේ අරමුණ විස්තර කරයි.<br>• ජාලයක භෞතික සැකසුම විස්තර කරයි.<br>• ජාලකරණයේ ගැටලු සාකච්ඡා කරයි. | 3 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | ○ සම්ප්‍රේෂණ මාධ්‍යය යොමුකාරක හා යොමුකාරක නොවන,<br>○ ජාල රැහැන් ඇඹරි යුගල, සමාක්ෂ, ප්‍රකාශ තන්තු,<br>○ මොඩමය, නාභි ස්විච්, මාර්ගකාරකය<br>• ජාල මෙහෙයුම් පද්ධති<br>• ජාල වර්ග<br>○ LAN<br>○ MAN<br>○ WAN<br>• ජාලකරණයේ වාසි හා අවාසි | | | | | |
| 3. පරිගණක පද්ධතියක දත්ත නිරූපණය වන ආකාරය විමර්ශනය කරයි. | 3.1. පරිගණක පද්ධතියක දත්ත නිරූපණය කිරීමට ද්විමය සංඛ්‍යා පද්ධතිය භාවිත කරයි. | • දත්ත නිරූපණය<br>○ 1 හා 0 භාවිතයෙන් අවස්ථා නිරූපණය<br>• ද්විමය සංඛ්‍යා පද්ධතිය | • අවස්ථා දෙකක් භාවිතයෙන් දත්ත නිරූපණය කළ හැකි බව පැහැදිලි කරයි.<br>• ධන නිඛිල දශම සංඛ්‍යා ද්විමය සංඛ්‍යා භාවිතයෙන් නිරූපණය කරයි. | 2 | | | |
| | 3.2. ධන නිඛිල දශමය සංඛ්‍යා ද්විමය අෂ්ටක හා ෂඩ් දශම සංඛ්‍යා බවට පරිවර්තනය කරයි. | • සංඛ්‍යා පද්ධති: දශමය සංඛ්‍යා ද්විමය අෂ්ටක හා ෂඩ් දශම<br>• පරිවර්තන ක්‍රම | • 8 හා 16 පාදය ලෙස ගෙන සංඛ්‍යා නිරූපණය කරයි.<br>• පරිවර්ථීත සංඛ්‍යාවල ස්ථානීය අගය ගණනය කරයි. | 2 | | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද | යෝජිත දිනය | නිමකළ දිනය | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | 3.3. ධන නිඛිල දශමය සංඛ්‍යා ද්විමය අෂ්ඨක හා ෂඩ් දශම සංඛ්‍යා අතර පරිවර්තනය කරයි. | • පරිවර්තන ක්‍රම<br>○ ද්විමය සිට දශම<br>○ ද්විමය සිට අෂ්ටක<br>○ ද්විමය සිට ෂඩ් දශම | • දශම හා ද්විමය ආකාර අතර ධන නිඛිල පරිවර්තනය සිදුකරයි.<br>• අෂ්ටක හා ද්විමය ආකාර අතර ධන නිඛිල පරිවර්තනය සිදු කරයි.<br>• ද්විමය හා ෂඩ් දශම සංඛ්‍යා අතර ධන නිඛිල පරිවර්තනය සිදු කරයි.<br>• අෂ්ටක හා ෂඩ් දශම සංඛ්‍යා අතර ධන නිඛිල පරිවර්තනය සිදු කරයි. | 3 | | | |
